මගේ අංකය - ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු/2023

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

<u>**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු අභියාචනා - 2023**</u>

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන හා 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය ප්‍රකාරව **2023.01.02** දින සිට ක්‍රියාත්මක වන පරිදි උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ සේවයේ සහ සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර, සංවර්ධන නිලධාරී) නිලධාරීන් සඳහා ලබාදී ඇති ස්ථානමාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව සලකා බැලීමෙන් පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙයට අමුණා ඇති (ඇමුණුම -01) ලේඛනයේ සඳහන් තීරණයන්ට එළඹ ඇත.

02. අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි ස්ථානමාරුවීම් අත්හිටුවා ඇති නිලධාරීන් සහ වෙනත් සේවා ස්ථාන වලට අනුයුක්ත කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අදාල නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

03. ස්ථානමාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩ වැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩ වැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

- ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථානමාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් පසුවය.

04. දැනට ප්‍රසූත නිවාඩු ලැබ සිටීම හේතුවෙන් ඉහත 03. හි පරිදි කටයුතු කිරීමෙන් පසු නියමිත දින ස්ථානමාරු නියෝග ලද සේවා ස්ථානයේ රාජකාරි බාරගැනීම සඳහා වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට නොහැකි වන අවස්ථාවන්හි දී එලෙස මුදා හැරීමට නොහැකි නිලධාරීන් කවුරුන්ද යන්න ස්ථානමාරු ලද සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියාට පිටපතක් සහිතව මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුය.

05. වර්තමාන සේවා ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කිරීම මත ස්ථානමාරුවීම් ඉල්ලා සිටින ලද නිලධාරීන් විසින් ඉල්ලුම් කරන ලද සේවා ස්ථානයක්ම ලබා දීමට හෝ ඉල්ලුම් කරන ලද සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේම එක් අධිකරණයක් ලබා දීමට හැකිතාක් දුරට කටයුතු කර ඇත. (උදාහරණයක් ලෙස ගම්පහ මහාධිකරණය ඉල්ලා සිටින ලද අවස්ථාවක ගම්පහ සිවිල් අභියාචනා මහාධිකරණය/ ගම්පහ දිසා අධිකරණය/ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණය ලබා දීමට හැකිතාක් දුරට කටයුතු කර ඇත.) ඇතැම් නිලධාරීන්ගේ ඉල්ලීම් අනුප්‍රාප්තිකයින් නොමැතිවීම නිසා ඉටු කර නොමැති අවස්ථාවල එම ඉල්ලීම් අනුප්‍රාප්තිකයන් ලද විගස ඉටු කිරීමට සටහන් කරගෙන ඇත. නිලධාරීන්ගේ දුෂ්කරතාවයන් සහ සේවා අවශ්‍යතාවයන් පිළිබඳව විනිශ්චයකාරවරුන් විසින් කරන ලද ඉල්ලීම් ද සලකා බලා ඇතැම් විට අනුප්‍රාප්තිකයන් රහිතව ස්ථානමාරුවීම් ලබා දී ඇති අවස්ථාවල එමඟින් ඇතිවන පුරප්පාඩු අනුප්‍රාප්තිකයන් ලද විගස පුරවාලීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

06. 2023 වාර්ෂික ස්ථානමාරු යටතේ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන්ට ස්ථානමාරු ලබා දීමේදී දකුණු පළාත තුල අඛණ්ඩව වසර 08කට අධික කාලයක් සේවය කරන ලද නිලධාරීන් දකුණු පළාතට ආසන්න වෙනත් අධිකරණයක් වෙත ස්ථානමාරු කරමින්, දකුණු පළාත තුල අධිකරණයක් සඳහා අයදුම් කරන ලද නිලධාරීන් සඳහා දකුණු පළාත තුල අධිකරණයක් ලබා දීමට කටයුතු කරන ලද අතර, සියලුම සේවා ඝනවලට අයත් නිලධාරීන් සම්බන්ධව එක් එක් ප්‍රදේශ අනුව හෙවත් ප්‍රාදේශීයව ඇති වී තිබෙන සුවිශේෂී තත්ත්වයන් පිළිබඳව පහත සඳහන් පරිදි සළකා බලා, නිසි ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් සහිතව අර්ධ වාර්ෂික ස්ථානමාරු වීම් - 2023 හෝ වාර්ෂික ස්ථානමාරු - 2024 <u>**යටතේ නැවත සළකා බැලීමට යටත්ව එම ස්ථානමාරු අවලංගු කිරීමට තීරණය කර ඇත.**</u>

- **අධිකරණ ලිපිකරු නිලධාරීන් සම්බන්ධව:-**

  ඇතැම් දුෂ්කර ප්‍රදේශවල අධිකරණ සඳහා (උදා: නුවරඑළිය, පුත්තලම, අම්පාර, හැටන් ආදී) ස්ථානමාරු ඉල්ලීම් ඉදිරිපත් නොවීම හෝ අවම ප්‍රමාණයක් ඉදිරිපත් වීම මත එම ප්‍රදේශවල අධිකරණ වෙත අනුප්‍රාප්තිකයන් නොමැති වීම නිසාද, සමහර ප්‍රදේශවල අධිකරණ සඳහා (උදා:රත්නපුර, බලංගොඩ, බදුල්ල, බණ්ඩාරවෙල ආදී) ස්ථානමාරුවීම් වලදී බහුතර නිලධාරීන් පිරිසක් ඉල්ලුම් කිරීම යන හේතු මත ඇතැම් නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් සළකා බැලීමට නොහැකි තත්ත්වයක් උද්ගතවී ඇත. එම නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත සඳහන් කර ඇති පරිදි නිසි ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් සහිතව අර්ධ වාර්ෂික ස්ථානමාරු වීම් - 2023 හෝ වාර්ෂික ස්ථානමාරු - 2024 යටතේ සළකා බැලීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සටහන් කර ගනු ලැබ ඇත.

- **අධිකරණ ලඝු ලේඛක නිලධාරීන් සම්බන්ධව:-**

  2023 වාර්ෂික ස්ථානමාරු යටතේ දකුණු පළාතේ අධිකරණ වෙත ලබා දුන් ස්ථානමාරු අවලංගු වී ඇති නිලධාරීන් සම්බන්ධව ඉදිරියේදී ඉහත සඳහන් කර ඇති පරිදි නිසි ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් සහිතව අර්ධ වාර්ෂික ස්ථානමාරු වීම් - 2023 හෝ වාර්ෂික ස්ථානමාරු - 2024 යටතේ සළකා බැලීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සටහන් කර ගනු ලැබ ඇත.

- **අධිකරණ යතුරු ලේඛක නිලධාරීන් සම්බන්ධව:-**

  දකුණු පළාතෙන් පිටත අධිකරණවල වසර 04ක සේවා කාලය සම්පූර්ණකර තිබියදීත් දකුණු පළාත තුල අධිකරණයක් වෙත ස්ථානමාරු ලබා ගැනීමට නොහැකිව සිටින නිලධාරීන්ගේ ස්ථානමාරු සළකා බැලීම සඳහා දකුණු පළාතේ අධිකරණයක් වෙත පළමු පත්වීම ලබා දී දැනට වසර 04ක සේවා කාලයක් සම්පූර්ණ කර ස්ථානමාරු ලැබීමට නියමිත නිලධාරීන් සඳහා 2023 වාර්ෂික ස්ථානමාරු යටතේ ලබා දුන් **<u>ස්ථානමාරු අවලංගු කිරීමට තීරණය කර ඇති අතර</u>** එම නිලධාරීන් සම්බන්ධයෙන්ද ඉහත සඳහන් කර ඇති පරිදි නිසි ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් සහිතව අර්ධ වාර්ෂික ස්ථානමාරු වීම් - 2023 හෝ වාර්ෂික ස්ථානමාරු - 2024 යටතේ සළකා බැලීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සටහන් කර ගනු ලැබ ඇත.

- **අධිකරණ පොත් බැඳුම්කරු නිලධාරීන් සම්බන්ධව:-**

  සමහර ප්‍රදේශවල අධිකරණ සඳහා (උදා:රත්නපුර, බලංගොඩ ආදී) ස්ථානමාරු අයදුම් කිරීමේදී එකම අධිකරණයක් වෙත බහුතර නිලධාරීන් පිරිසක් ඉල්ලුම් කිරීම හේතුවෙන් එම ප්‍රදේශවල අධිකරණ වෙත ස්ථානමාරු ඉල්ලුම් කරන ලද නිලධාරීන්ගේ ස්ථානමාරු වීම් සළකා බැලීමට නොහැකි වී ඇත. එම නිලධාරීන් සම්බන්ධයෙන්ද ඉහත සඳහන් කර ඇති පරිදි නිසි ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුම් දීමක් සහිතව අර්ධ වාර්ෂික ස්ථානමාරු වීම් - 2023 හෝ වාර්ෂික ස්ථානමාරු - 2024 යටතේ සළකා බැලීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සටහන් කර ගනු ලැබ ඇත.

07. *යම් යම් කාල වකවානුවල දී උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ විවිධ සේවා ඝන සඳහා සමහර ප්‍රදේශවලින් වැඩි වශයෙන් පිරිස් තේරී පත්වී තිබීම හේතුවෙන්ද;

* දැනට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ පවතින සැළකිය යුතු පුරප්පාඩු ප්‍රමාණය හේතුවෙන්ද;

*දැනට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට නව බඳවා ගැනීම් සඳහා ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන්ද;

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිලධාරීන්/ නිලධාරිනියන් විසින් ඉල්ලුම් කරන ලද සේවා ස්ථානයක් හෝ ඊට ආසන්න සේවා ස්ථානයක් ලබා දීමට දුෂ්කරතා මතුව ඇති බව ඔබගේ අවධානයට ලක් කරමි.

08. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථානමාරු නියෝග කර ඇත්නම් පමණි. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සහ සංයුක්ත දීමනා සඳහා හිමිකම් ලැබේ.

09. තවද ඉහත 02, 03 සහ 04 ඡේදයන්ට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ස්ථානමාරු නියෝග අනුව ස්ථානමාරු නියෝග ලද සියළුම නිලධාරීන්ට (නිශ්චිත දිනයක් සඳහන් කරන ලද ස්ථානමාරු හැර) **2023.01.02** දින නව සේවා ස්ථානයේ රාජකාරී සඳහා වාර්තා කිරීමට හැකි වන පරිදි **<u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u>** වර්තමාන සේවා ස්ථානයෙන් **<u>මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු බවද</u>** අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2022 දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12